ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දියාව මන්නාරම මඩු දේවස්ථානයේ සංක්‍රමණ නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අමතර අරමුදල් ලබා දේ

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්. එස්. සත්‍යානන්ද මහතා 2024 ජූලි 02 වන දින මන්නාරමේ මඩු දේවස්ථානය වැඳ පුදා ගැනීමට පැමිණෙන ජනතාව වෙනුවෙන් සංක්‍රමණ නිවාස ඉදිකිරීම සඳහා නව ක්‍රමවේදයන් විධිමත් කිරීම සඳහා රාජ්‍ය තාන්ත්‍රික ලේඛන අත්සන් තබා ඒවා හුවමාරු කර ගන්නා ලදී. මෙය ඉන්දියාව විසින් ව්‍යාපෘතිය සඳහා අමතර ශ්‍රී ලංකා රුපියල් මිලියන 100ක් පමණ ලබාදීමට ගත් තීරණය අනුව සිදු කරන ලදී. මේ සමඟ ව්‍යාපෘතිය සඳහා ඉන්දීය රජයේ සමස්ත කැපවීම ශ්‍රී ලංකා රුපියල් මිලියන 400කට අධික ය.

2. ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් අභියෝග සැලකිල්ලට ගනිමින් ඉන්දීය රජය දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන් නවයක් ඒවායේ මුල් වපසරිය තුළ ඉදිකිරීමේ පිරිවැයෙහි සැලකිය යුතු ඉහළයාමේ බලපෑම අවම කරන අතරතුර ඒවා කඩිනමින් අවසන් කිරීම සඳහා අමතර අරමුදල් ලබා දීමට තීරණය කළේය. මඩු දේවාස්ථාන පරිශ්‍රයේ ඉදිවන අඩු පිරිවැය සංක්‍රමණ නිවාස ව්‍යාපෘතිය ද එම ව්‍යාපෘති නවයෙන් එකකි.

3. ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ මඩු දේවස්ථානය වැඳ පුදා ගැනීමට පැමිණෙන වන්දනාකරුවන්ගේ භාවිතය සඳහා දැන් ඉදිකෙරෙන මුළු නිවාස ගණන 96 කි. මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර යෝජිත සංක්‍රමණ නිවාස ඉදිකිරීමේ විවිධ අදියරවල පවතී.

***

කොළඹ
2024 ජූලි 03